සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## AA3 විභාගය - 2018 ජූලි

## (AA34) ක්‍රියාවලීන්, පාලනයන් සහ විගණනය

(Processes, Controls and Audit)

2018-07-21
පස්වරු
[1.45 – 5.00]

පිටු ගණන : 08
ප්‍රශ්න ගණන: 09

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):
  - (1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
    *උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*
  - (2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***
  - (3) *ඉල්ලුම් කරන ලද **මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,** ඔබ වෙත සපයන ලද **පොත්වල උත්තර** ලියන්න.*
  - (4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*
  - (5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර **පමණක්** භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*
  - (6) *අර්ථකථන සහිත **කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව** අමුණා ඇත. සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*
  - (7) *ලකුණු 100.*

---

## A කොටස

අනිවාර්යය ප්‍රශ්න හතර (04) කි.

(මුළු ලකුණු 20)

### 01 වන ප්‍රශ්නය

**රූපසිංහ මහතා** සහ එම **මහත්මිය** කැනඩාවේ වර්ෂ හයක් සේවය කිරීමෙන් පසු ශ්‍රී ලංකාවට ආපසු පැමිණ සිටී. ඔවුන් රු. මිලියන 10 කට ආසන්න මුදලක් ඉතිරිකරගෙන ඇති අතර, ඔවුන්ගේම ව්‍යාපාර සංවිධානයක් ආරම්භ කිරීමට සැලසුම් කරමින් සිටී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **රූපසිංහ මහතා** සහ එම **මහත්මියට** ආරම්භ කළ හැකි ව්‍යාපාර සංවිධාන වර්ග දෙකක්(02) **සඳහන් කරන්න.** (ලකුණු 02)

(b) ඕනෑම ව්‍යාපාර සංවිධානයක පොදු අරමුණු තුනක්(03) **හඳුනා දක්වන්න.** (ලකුණු 03)

(මුළු ලකුණු 05)

### 02 වන ප්‍රශ්නය

වෘත්තියේ යෙදෙන්නෙකු විසින් සහතිකවීමේ කාර්යභාරයක් බාරගන්නා විට, එම කාර්යභාරය සාධාරණ සහතිකවීමේ කාර්යභාරයක්ද නැතහොත් සීමිත සහතිකවීමේ කාර්යභාරයක්ද යන්න පැහැදිලිව මූලාරම්භයේ සිටම අවබෝධ කරගතයුතු වන්නේ එය වෘත්තියේ යෙදෙන්නා විසින් ඉටුකරනු ලබන කාර්යයන් කෙරෙහි බලපෑ හැකි බැවිනි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

සාධාරණ සහතිකවීමේ කාර්යභාරය (reasonable assurance engagement) සහ සීමිත සහතිකවීමේ කාර්යභාරය (limited assurance engagement) අතර වෙනස්කම් තුනක්(03) **හඳුනා දක්වන්න.** (ලකුණු 05)

## **03** වන ප්‍රශ්නය

**සනත්,** ශ්‍රී ලාංකිය මැණික් වෙළඳාමේ යෙදී සිටින ප්‍රධාන පෙළේ සිල්ලර වෙළෙඳ ආයතනයක් වන **සීමාසහිත රිජන්ට් සමාගමේ** 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන විගණනය කරන කණ්ඩායමේ සාමාජිකයෙකි. **සීමාසහිත රිජන්ට් සමාගමේ** වර්ෂ අවසාන තොග ශේෂය පිලිබඳ විගණන පටිපාටි ඉටුකිරීමේ කාර්යය ඔහු වෙත පවරා ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**සීමාසහිත රිජන්ට් සමාගමේ** වර්ෂ අවසාන තොග ශේෂය විගණනය කිරීමේදී, අවධාරණය යොමු කළයුතු මූල්‍ය ප්‍රකාශන සෑදහුම් (financial statement assertions) දෙකක්(02), එක් එක් සෑදහුම සඳහා ඉටුකළ යුතු විගණන පටිපාටියක්ද සමග **පැහැදිලි කරන්න.** (ලකුණු 05)

## **04** වන ප්‍රශ්නය

ආයතනය තුළ තත්ත්ව පාලනය සඳහා නායකත්වයේ වගකීම, අදාළ ආචාරධර්ම අවශ්‍යතා, සේවාදායක සම්බන්ධතා බාරගැනීම සහ පවත්වාගෙන යාම, මානව සම්පත්, කාර්යභාරය ඉටුකිරීම සහ අධීක්ෂණය වැනි මූලිකාංග අවධාරණය කිරීම සඳහා තත්ත්ව පාලන පද්ධතියක් (system of quality control) ආයතනය විසින් පිහිටුවා පවත්වාගෙන යා යුතුය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ආයතනය තුළ තත්ත්ව පාලන පද්ධතියක් පිහිටුවා පවත්වාගෙන යාමේ අරමුණ **සඳහන් කරන්න**. (ලකුණු 03)

(b) ආයතනයක් විසින් සේවාදායකයන් සමග සම්බන්ධතා බාරගතයුතු හෝ පවත්වාගෙන යායුතු අවස්ථා දෙකක්(02) **හඳුනා දක්වන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 05)

*A කොටසෙහි අවසානය*

## <u>B කොටස</u>

අනිවාර්යය ප්‍රශ්න තුන (03) කි.

(මුළු ලකුණු 30)

## **05** වන ප්‍රශ්නය

(A) අස්තිත්වය සහ එහි පරිසරය පිලිබඳ අවබෝධකර ගැනීමේදී විගණක විසින් සලකා බලනු ලබන පොදු ක්ෂේත්‍රවලින් එකක් වන්නේ අස්තිත්වයේ අභ්‍යන්තර පාලනයයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

අස්තිත්වයේ අභ්‍යන්තර පාලන පද්ධතියේ සංරචක තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(B) (a) විගණන අවදානම යනු, මූල්‍ය ප්‍රකාශන තුළ ප්‍රමාණාත්මක අවප්‍රකාශන පවතින විට, විගණක විසින් යෝග්‍ය නොවන විගණන මතයක් ප්‍රකාශ කිරීමට ඇති අවදානම වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ආවේණික අවදානම (inherent risk) යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැයි **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(b) පහත සඳහන් ගනුදෙනු වෙනස් වූ අස්තිත්වයන්ට අදාල වේ:

(i) **සීමාසහිත කප්ස් සමාගම** කඩදාසි කෝප්ප නිපදවීමේ ව්‍යාපාරයේ යෙදී සිටින අතර, **සීමාසහිත බටර්කේක් සමාගම**, බටර් කේක් විකුණන බේකරියක් පවත්වාගෙන යාමේ ව්‍යාපාරයක නිරතව සිටී. **සීමාසහිත කප්ස් සමාගම** සහ **සීමාසහිත බටර්කේක් සමාගම** ඔවුන්ගේ ව්‍යාපාර ඒකාබද්ධ කර **සීමාසහිත කප් කේක් සමාගම** නමැති නව ව්‍යාපාරයක් පවත්වාගෙන යාමට තීරණය කරන ලදී. යෝජිත ඒකාබද්ධ කිරීමේ ගනුදෙනුව සඳහා සංකීර්ණ ගිණුම්කරන මූලධර්ම සහ ව්‍යාපාර දෙකෙන්ම සැලකිය යුතු කළමනාකරණ මැදිහත්වීම් ඇතුලත් වෙතැයි අපේක්ෂා කෙරේ.

(ii) **සීමාසහිත ටැප්රෝ ලංකා සමාගම (TL)** ලෝක වෙළෙඳ මධ්‍යස්ථානයේ [World Trade Centre (WTC)] නැගෙනහිර කුළුණේ කාර්යාල පරිශ්‍රයක් මෙහෙයුම් බද්දක් (operating lease) මත බදුගෙන ඇත. සෑම මාසයක් ආරම්භයේදී, රු.450,000/- ක කුල්බදු ගෙවීමක් **TL** විසින් WTC හි අයිතිකරුවන් වෙත මුදලින් ගෙවනු ලැබේ. ගෙවීම් කිරීමෙන් පසු ගිණුම්කරණ වාර්තා යාවත්කාලීන කරනු ලැබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ඉහත සඳහන් එක් එක් සිද්ධිය (scenarios) මගින් සැලකිය යුතු අවදානම් ඇතිකරනු ලැබේදැයි හේතු දක්වමින් **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## 06 වන ප්‍රශ්නය

**සීමාසහිත සෝමරත්න සහ පුත්‍රයෝ සමාගම** පාරිභෝගික ද්‍රව්‍ය සිල්ලර වෙළඳාමේ යෙදී සිටින සමාගමකි. සමාගමේ ප්‍රධාන කාර්යාලය සහ සමාගමට අයත් වෙළෙඳසැල යන දෙකම මහනුවර ස්ථානගත වී ඇත. 2017 මැයි මාසයේ හටගත් ගංවතුරෙන් එහි වෙළෙඳසැලට සහ ප්‍රධාන කාර්යාලයට බරපතල හානි සිදුවිය. සමාගමේ කාර්යමණ්ඩලයට කල් ඇතිව ඉවත්වීමට නොහැකි වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස උපකාරක ලියවිලිද ඇතුළුව සමාගමේ සියලුම වාර්තාවලින් 95%ක් පමණ සම්පූර්ණයෙන් විනාශ විය. පිටපත් තබාගැනීමේ (backup) පටිපාටියක්ද සමාගම සතු නොවීය.

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **සීමාසහිත සෝමරත්න සහ පුත්‍රයෝ සමාගමේ** මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඔබගේ විගණන ආයතනය පත්කර ඇති බව උපකල්පනය කරන්න.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) පොදුවේ විකරණය කළ මතයක් (modified opinion) අවශ්‍යකරන අවස්ථාවක් උදාහරණයක් ද සමග **හඳුනා දක්වන්න**. (ලකුණු 04)

(b) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **සීමාසහිත සෝමරත්න සහ පුත්‍රයෝ සමාගමේ** මූල්‍ය ප්‍රකාශන මත නිකුත් කරනු ලබන්නේ කුමන වර්ගයේ විගණන මතයක්දැයි **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(c) සමාගම සියලුම ගිණුම්කරණ වාර්තාවල පිටපත් (back-ups) නිසිපරිදි පවත්වාගනු ලැබුවේ නම්, ඉහත (b) කොටස සඳහා උත්තරය කෙසේ වෙනස්වනු ඇත්දැයි **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

## **07** වන ප්‍රශ්නය

(a) පුළුල් පරාසයක පැතිරුණු අවස්ථා සහ සම්බන්ධතා මගින්, මූලික මූලධර්මවලට අනුකූලවීම තර්ජනයකට ලක්විය හැකිය. මූලික මූලධර්මවලට අනුකූලවීමේදී ඇතිවන තර්ජන වර්ග කිපයකට ඇතුලත් වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

මූලික මූලධර්මවලට අනුකූලවීමේදී ඇතිවන පහත දැක්වෙන තර්ජන වර්ග **පැහැදිලි කරන්න**.

(i) ස්වයං-සමාලෝචන තර්ජනය (Self-review threat).

(ii) බියගැන්වීමේ තර්ජනය (Intimidation threat). (ලකුණු 04)

(b) **සීමාසහිත ඇන් පොදු සමාගම** යනු **ද සිල්වා ඇසෝසියේට්ස්** නම් වූ ඔබගේ විගණන ආයතනයේ ප්‍රධාන සේවාදායකයන් තිදෙනාගෙන් එකකි. **ද සිල්වා ඇසෝසියේට්ස්** හි මුළු වාර්ෂික ගාස්තු ආදායම රු. මිලියන 12 ක් වන අතර, රු. මිලියන 4 ක ගාස්තුවක් **සීමාසහිත ඇන් පොදු සමාගම** විසින් වාර්ෂිකව ගෙවනු ලැබේ. 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළදී **සීමාසහිත ඇන් පොදු සමාගම** සැලකිය යුතු වෙළෙඳපොළ සංවර්ධන වියදමක් දැරූ අතර, ඔවුන් එය ජංගම නොවන වත්කමක් ලෙස ප්‍රාග්ධනිත කර තිබුණි. කෙසේවුවද මෙම වියදම, ප්‍රාග්ධනිත කිරීමට අදාල නිර්ණායක සම්පූර්ණ කර නොමැති අතර, නිවැරදි ගිණුම්කරණ සැලකීම වන්නේ මෙය වියදමක් ලෙස ආදායම් ප්‍රකාශනයට අයකිරීම වේ. **සීමාසහිත ඇන් පොදු සමාගම** මගින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ක්‍රමයට **ද සිල්වා ඇසෝසියේට්ස්** ආයතනය එකඟ නොවන්නේ නම් එකී සමාගම විගණකවරුන් ලෙස නැවත පත් නොකරන බව **සීමාසහිත ඇන් පොදු සමාගම** දන්වා තිබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ඉහත සිද්ධියෙන් දක්වා ඇති පරිදි **ද සිල්වා ඇසෝසියේට්ස්** ආයතනයට අදාල වන, මූලික මූලධර්මවලට අනුකූලවීම කෙරෙහි ඇති තර්ජන **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

# C කොටස

අනිවාර්යය ප්‍රශ්න දෙක (02) කි.

(මුළු ලකුණු 50)

## **08** වන ප්‍රශ්නය

(A) ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය ඒකාබද්ධව 2013 දී නිකුත් කරන ලද, සංයුක්ත පාලනය (Corporate Governance) සඳහා වූ යහපත් පරිචයන් අඩංගු සංග්‍රහය මගින් ශ්‍රී ලංකාවේ සංයුක්ත පාලනය පිළිබඳ මගපෙන්වීම සපයා ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) සංයුක්ත පාලනයේ වැදගත්කම **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(b) සංයුක්ත පාලනය සඳහා වූ යහපත් පරිචයන් අඩංගු සංග්‍රහයේ අවධාරණය (highlighted) කර ඇති මගපෙන්වීම් (guidelines) තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(B) මෝස්තර නිර්මාණකරණයෙහි අති දක්ෂයෙකු වූ **මඩපාත මහත්මියට** මෝස්තර නිර්මාණකරණය වෙනුවෙන් 2016 වර්ෂයේදී ප්‍රදානයක් හිමි විය. ප්‍රදානය ලැබීමෙන් පසු මෝස්තර නිර්මාණකරණය සම්බන්ධ ඇණවුම් වැඩිවූ බැවින් ඇය රු. මිලියන 30 ක බැංකු ණය පහසුකමක්ද සහිතව කුඩා ඇඟළුම් නිෂ්පාදන ආයතනයක් ආරම්භ කරන ලදී. ඇයට ගිණුම්කරණය පිළිබඳ දැනුමක් නොතිබූ අතර, ඇගේ මූල්‍ය කටයුතු කළමනාකරණය කර ගැනීම සඳහා ගණකාධිකාරීවරයෙකු බඳවා ගැනීම කෙරෙහි ඇගේ බැංකුවේ කළමනාකරු විසින් කිහිප විටක් අවධාරණය කරන ලදී. ඇයගේ ව්‍යාපාරයේ ගණකාධිකාරී ලෙස ඔබ බඳවා ගන්නා ලදැයි උපකල්පනය කරන්න. මෙම සතිය අදාල කාර්යාලයේ ඔබේ ප්‍රථම සතිය වන අතර, පහත සඳහන් තොරතුරු ඔබ රැස්කරගෙන ඇත:

(1) කර්මාන්තශාලා ගොඩනැගිල්ල ඉදිකිරීම දැන් බොහෝ දුරට නිමාවී තිබුණි. **මඩපාත මහත්මිය** සිල්ලර වෙළෙඳසැල්වලට ඇණවුම් හයක් දැනටමත් සම්පූර්ණ කර සපයා ඇත.

(2) මෙම කර්මාන්තශාලාවේ සේවකයින් හතලිස් පස් (45) දෙනෙකු සේවය කරති.

(3) අවස්ථා කිහිපයකදීම **මඩපාත මහත්මිය** විසින්ම දේශීය වෙළෙඳපලෙන් රෙදි මිලදීගෙන තිබුණද, දැනට මිලදී ගැනීමේ කටයුතු සිදුකිරීම සඳහා අධීක්ෂකයෙකු සම්බන්ධ වේ.

(4) එක් මසක ණය පදනම මත මිලට ගැනුම් සිදුකරනු ලැබේ.

(5) පසුගිය සතියේ එක් ගැනුම් ඇණවුමක් සැපයුම්කරුට ආපසු යවන ලද්දේ එය අවශ්‍ය තත්ත්ව පිරිවිතරයන් (quality specifications) සමඟ එකඟ නොවන බැවිනි.

(6) තවද, බොහෝ අවස්ථාවලදී සැපයුම්කරුවන් විසින් වැරදි ගණන්වලට හෝ බාරදී නොමැති භාණ්ඩ සඳහා හෝ ඉන්වොයිසි ඉදිරිපත් කරනු ලැබේ.

(7) අධීක්ෂක විසින් සමහර අයිතම **මඩපාත මහත්මිය** කලින් මිලදී ගත් මිල ගණන්වලට වඩා වැඩි මිල ගණන්වලට මිලදීගෙන තිබේ.

(8) අද්විතීය (unique) මෝස්තර හේතුවෙන් ඉල්ලුම වැඩිවී ඇති අතර, ව්‍යාපාරයේ වේගවත් වර්ධනයක් අපේක්ෂා කෙරේ.

මිලදී ගැනීමේ ක්‍රියාවලිය අධීක්ෂණයට ලක්කොට ඔබ විසින් සැලකිලිමත්වන කරුණු ඇයට වාර්තාකරන ලෙස අවසන් වරට සිදුකරන ලද සාකච්ඡාවේදී ඇය ඉල්ලා සිටියාය. අස්තිත්වය තුළ හොඳ අභ්‍යන්තර පාලන පද්ධතියක් තිබීමේ වැදගත්කම ඔබ විසින් සාකච්ඡාවේදී සඳහන් කර තිබුණි. හොඳ අභ්‍යන්තර පාලන ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමෙන් ආයතනය තුළ වැරදි, අතපසුවීම් සහ වංචා නොවන බවට 100% ක සහතිකවීමක් ලබාගත හැකිදැයි දැනගැනීමට **මඩපාත මහත්මියට** අවශ්‍යව ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **මඩපාත මහත්මියගේ** සංවිධානයට යෝග්‍ය වන මිලදී ගැනීමේ ක්‍රියාවලිය (purchasing process) **පැහැදිලි කරන්න.**
(වඩා හොඳ මිලදී ගැනීමේ ක්‍රියාවලියක පියවරයන් අඩුතරමින් 4 ක් සමඟ ඔබේ උත්තරය සනාථ කළ යුතුය.) (ලකුණු 08)

(b) හොඳ මිලදීගැනීමේ ක්‍රියාවලියක් ක්‍රියාත්මක කිරීමෙන් තුනී කරගත හැකි (mitigated) අවදානම් තුනක්(03) **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(c) සංවිධානය තුළ හොඳ අභ්‍යන්තර පාලන පද්ධතියක් තිබීමෙන් 100% ක් වැරදිවලින් තොර වූ තත්ත්වයක් **මඩපාත මහත්මියට** ලබාගත හැකිදැයි **විමසන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 25)

## **09** වන ප්‍රශ්නය

(A) ඔබගේ විගණන සමාගමේ සේවාදායකයන්ගෙන් කෙනෙකු වන **සීමාසහිත සොන්ටෝ ලංකා පොදු සමාගම** විශේෂ කාර්යයක් සඳහා ඔබගේ විගණන ආයතනය වෙත පැමිණ ඇත. **සීමාසහිත සොන්ටෝ ලංකා පොදු සමාගමේ** පරිපාලක සමාගම (parent) වන එක්සත් රාජධානියේ සමාගමක් වන **සොන්ටෝ UK Org සමාගම,** නියාමක (regulator) වෙත ඉදිරිපත් කිරීම සඳහා සම්බන්ධිත පාර්ශව ගනුදෙනු සහ සම්බන්ධතා පිළිබඳ ප්‍රකාශනයක් පිළියෙල කරන ලෙස **සීමාසහිත සොන්ටෝ ලංකා පොදු සමාගමෙන්** විශේෂයෙන් ඉල්ලා ඇත.

**සීමාසහිත සොන්ටෝ ලංකා පොදු සමාගමේ** අධ්‍යක්ෂකවරු විසින් 2018 ජුනි 30 දිනෙන් අවසන් හයමාසය සඳහා මෙම ප්‍රකාශනය පිළියෙල කර ඇත. LKAS 24 - සම්බන්ධිත පාර්ශව හෙළිදරව් කිරීම් යන ගිණුම්කරණ ප්‍රමිතයෙහි මූලධර්මවලට අනුකූල වන ලෙස මෙම ප්‍රකාශනය පිළියෙල කර තිබේ. මෙම ප්‍රකාශනය **සීමාසහිත සොන්ටෝ ලංකා පොදු සමාගමේ** විගණක මගින් පරීක්ෂා කර මෙහි අන්තර්ගතය LKAS 24 හි මූලධර්මවලට අනුකූලදැයි මතයක් ප්‍රකාශ කරවා ගැනීමට පරිපාලක සමාගමට අවශ්‍යව ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ඉහත කාර්යභාරය, සහතිකවීමේ කාර්යභාරයක්දැයි **තක්සේරු කරන්න.** (ලකුණු 05)

(B) මෘදුකාංග විසඳුම් සමාගමක් වන **සීමාසහිත ටෙක්ස් කනෙක්ෂන්ස් (පෞද්ගලික) සමාගමේ (TC)** විගණක ලෙස ඔබේ ආයතනය පත්කර තිබේ. මෙය අලුත් විගණනයක් වන අතර, කාර්යභාර හවුල්කරු (engagement partner) විසින් මෙම විගණනය සඳහා විගණන කණ්ඩායමේ ජ්‍යෙෂ්ඨයා ලෙස ඔබ පත්කර තිබේ. පහත සඳහන් කෙටුම්පත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශන සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශන ඔබ වෙත සපයා දී තිබේ:

**කෙටුම්පත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශන** *(රු.'000)*

| **දිනෙන් අවසන් වර්ෂය සඳහා** | **2018 මාර්තු 31** | **2017 මාර්තු 31** |
|---|---|---|
| **ආයභාරය:** | | |
| මෘදුකාංග සංවර්ධනයන් | 18,750 | 45,320 |
| වාර්ෂික නඩත්තු ගිවිසුම් මත ගාස්තු | 1,120 | 6,512 |
| දෘඩාංග (hardware) විකුණුම් | 1,552 | 322 |
| | **21,422** | **52,154** |
| **වියදම්:** | | |
| වැටුප් | 16,564 | 21,462 |
| සේවක අර්ථ සාධක අරමුදල (EPF) සහ සේවක භාර අරමුදල (ETF) | 23 | 1,719 |
| ගමන් වියදම් | 565 | 3,765 |
| කාර්යාල නඩත්තු | 3,265 | 340 |
| දුරකතන සහ විදුලිය | 1,654 | 1,265 |
| පරිගණක නඩත්තුව | 765 | 915 |
| | **22,836** | **29,466** |
| **ලාභය / (අලාභය)** | **(1,414)** | **22,688** |

**කෙටුම්පත් මූල්‍ය තත්ත්ව ප්‍රකාශන** *(රු.'000)*

| දිනට | 2018 මාර්තු 31 | 2017 මාර්තු 31 |
|---|---|---|
| **ජංගම නොවන වත්කම්:** | | |
| ඉඩම සහ ගොඩනැගිල්ල | 2,550 | 5,720 |
| මෝටර් වාහනය - වෑන් රථය | 4,300 | 4,300 |
| ලී බඩු සහ සවිකිරීම් | 656 | 652 |
| | **7,506** | **10,672** |
| **ජංගම වත්කම්:** | | |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් | 8,565 | 750 |
| මුදල් සහ මුදල්වලට සමාන දෑ | 1 | 8 |
| | **8,566** | **758** |
| **මුළු වත්කම්** | **16,072** | **11,430** |
| **ස්කන්ධය:** | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය - සාමාන්‍ය කොටස් | 1,500 | 1,500 |
| රඳවාගත් ඉපැයීම් | 675 | 2,089 |
| | **2,175** | **3,589** |
| **ජංගම වගකීම්:** | | |
| බැංකු ණය | 6,100 | - |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | 4,100 | 2,730 |
| සම්බන්ධිත පාර්ශව සඳහා ගෙවිය යුතු මුදල් | 3,697 | 5,111 |
| | **13,897** | **7,841** |
| **මුළු ස්කන්ධය සහ වගකීම්** | **16,072** | **11,430** |

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) උදාහරණයක් සහිතව "විගණන සාක්ෂි" යන පදය **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(b) **සීමාසහිත ටෙක්ස් කනෙක්ෂන්ස් (පෞද්ගලික) සමාගමේ** විගණන පටිපාටි ඉටුකිරීමේදී ඔබගේ විශේෂ අවධානය යොමුවිය යුතු ක්ෂේත්‍ර අටක්(08) **හඳුනා දක්වන්න.** (ලකුණු 08)

(c) 2018 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඉදිරිපත් කර ඇති සම්බන්ධිත පාර්ශව සඳහා ගෙවිය යුතු ශේෂය වන රු.3,697,000/- සම්බන්ධයෙන් ඔබ විසින් ඉටුකරනු ලබන විගණන පටිපාටි හයක්(06) **ලැයිස්තුගත කරන්න**. (ලකුණු 06)

ඉහත (b) කොටස යටතේ ඔබ හඳුනා දැක්වූ ක්ෂේත්‍ර තහවුරු කරගැනීම සඳහා කළමනාකරණ නියෝජන ලිපියක් ලබාදෙන ලෙස **සීමාසහිත ටෙක්ස් කනෙක්ෂන්ස් (පෞද්ගලික) සමාගමේ** කළමනාකාරිත්වයෙන් ඔබ ඉල්ලා ඇත. කෙසේවෙතත්, කළමනාකාරිත්වය විසින් ඔබ ඉල්ලා සිටි ලිඛිත නියෝජනය ලබාදී නැත.

(d) මෙවැනි තත්ත්වයක් යටතේ ඔබ විසින් ගනු ලබන ක්‍රියාමාර්ග දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 25)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 01 මට්ටම<br>**අවබෝධය**<br><br>වැදගත් තොරතුරු ආවර්ජනය සහ පැහැදිලි කිරීම. | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |
| | **අදින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | **හඳුනා දක්වන්න** | යමක් මනා සැලකිලිමත් වීමකින් අනතුරුව හඳුනා ගැනීම හෝ තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව අදාල කරුණු එකින් එක වචනයෙන් ලියා දැක්වීම. |
| | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාවය පෙන්නුම් කිරීම හෝ තහවුරු කිරීම. |
| | **සඳහන් කරන්න** | යමක් ස්ථිර ලෙස පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම. |
| | **විමසන්න** | අවසන් නිගමනයකට පිවිසීම සඳහා විවිධ පැතිකඩ තර්කානුකූලව සවිස්තරව පරික්ෂා කිරීම. |
| | **පැහැදිලි කරන්න** | අදාල කරුණු සවිස්තරාත්මකව දැක්වීම. |
| | **අර්ථකතනය කරන්න** | අවබෝධයට පහසු සුපුරුදු පද මගින් අර්ථය ඉදිරිපත් කිරීම. |
| | **හඳුනාගන්න** | සෙවීමෙන් හෝ ප්‍රයත්න දැරීමෙන් නිගමනයකට එළඹීම. |
| | **සටහන් කරන්න** | අදාල කරුණු විස්තරාත්මකව සටහන් කිරීම. |
| | **සාරාංශගත කරන්න** | කරුණු වශයෙන් හෝ සංඛ්‍යා වශයෙන් ප්‍රධාන කරුණු කෙටියෙන් දැක්වීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 02 මට්ටම<br>**භාවිතය**<br><br>ඉගෙනගත් පසුබිම නොවන පසුබිමක දැනුම භාවිත කිරීම / සංවෘත ගැටළු විසඳීම. | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යොදන්න. |
| | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | **ප්‍රදර්ශනය කරන්න** | සුවිශේෂී ලෙස උදාහරණ සමග ඔප්පු කරන්න. |
| | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | **පිළියෙල කරන්න** | දී ඇති විස්තර සැලැස්මකට ගොනු කිරීම. |
| | **ප්‍රමුඛතා දක්වන්න** | වැදගත්කම, අනුපිළිවෙල අනුව දක්වන්න. |
| | **සසඳන්න** | තවත් දෙයක් සමග සංගත වේදැයි බැලීම. |
| | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 03 මට්ටම<br>**විශ්ලේෂණය**<br><br>අදහස් අතර සම්බන්ධතා ගොඩනගා සමාන අසමානතා බැලීම / විවෘත ගැටළු විසඳීම. | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරික්ෂා කරන්න. |
| | **සමානකම් බලන්න** | සමානකම් සොයා ගැනීම පිණිස පරික්ෂා කිරීම. |
| | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරික්ෂා කිරීම. |
| | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |